# දොම්පෙ ප්‍රාදේශීය සභාව.

## ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 27 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති දොම්පෙ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු.165,705 ක පොත් පරිත්‍යාග ගිණුමට ගලපනු වෙනුවට ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමට ගලපා තිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.106,352,355 ක් හා රු.62,717,832 ක් වැයකර ඉදිකරවන ලද කිරිදිවැල සහ පූගොඩ සතිපොළ සභාවේ වත්කමක් ලෙස ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) 2012 දෙසැම්බර් බැංකු ප්‍රකාශය අනුව රු.595,646 ක ණය වාරික හා පොලී මුදල් අඩුකර තිබුණද, ගෙවියයුතු බැංකුණය හා පොලී ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව සභාව සතු රු.5,319,869 ක් වටිනාකම ඇති ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගතකර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයේ ඔක්තෝබර් මස බැංකු සැසඳුමේ වෙනත් බැර යටතේ තිබූ බැරකම් රු.19,884,367 ක් එම වර්ෂයේ ගිණුම්ගත කර නොතිබීම හා එම ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා 2011 සඳහා සංශෝධිත මුදල් පොතක් සකස් කර තිබූ අතර, එම වටිනාකම මුදල් පොත හර කර නැවත බැර කර සමුච්චිත අරමුදලට හර කර තිබීම නිසා සමුච්චිත අරමුදල රු.19,884,367 කින් අඩුවෙන් දැකවිණි.

(ඊ) ලැබියයුතු වැටුප් ප්‍රතිපූර්ණ ලේඛනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.4,418,641 ක් වුවත් ලෙජරය අනුව රු.3,298,932 ක් ලෙස දක්වා තිබුණි.

(උ) 2008 හා 2009 වර්ෂවල ලැබුණු උසාවි දඩ මුදල රු.141,499 ක්ද, 2008 සිට 2012 දක්වා ලැබුණු මුද්දර ආදායම් රු.108,114 ක්ද, තැන්පතු ගිණුමට ඇතුළත්කර තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

(අ) ඉකුත් වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම අනුව රු.8,267,179 ක්ව තිබූ ඌනතාවය ගැලපීම් කිරීමෙන් පසු රු.856,382 ක අතිරික්තයක් ලබා ගෙන තිබූ අතර ඒ සඳහා අනුමත ජ'නල් සටහන් හෝ පැහැදිලි කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 විගණිත මුදල් ගිනුමට 2,884,367 ක් හර කර තිබූ අතර, බැර කරන ලද ගිණුම් හදුනාගත නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 19,606,421 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 22,020,899 ක් විය.

2.**2** <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් හා බදු | 5,723 | 6,698 | 5,099 |
| (ii) | බදුකුලී | 12,309 | 12,118 | 564 |
| (iii) | බලපත්‍ර ගාස්තු | - | - | 25 |
| (iv) | වෙනත් ආදායම් | 66,266 | 86,083 | 16,875 |

2.2.2 **<u>වරිපනම් බදු</u>**

උප කාර්යාලවල වසර 05 ඉක්මවූ හිඟ වරිපනම් බදු හා අක්කර බදු පිළිබඳව විස්තර පහත පරිදි විය.

| උපකාර්යාලය | වරිපනම් බදු | අක්කර බදු |
|---|---|---|
| | රු. | රු. |
| වැකේ | 1,657,076 | 34,746 |
| දොම්පෙ | 2,253,070 | 76,954 |
| කැරගල | 91,818 | 28,487 |
| පූගොඩ | 1,235,782 | 30,633 |

2.2.3 **<u>කඩකාමර බදුදීම</u>**

කිරිඳිවැල නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 11 ක් 2013 ජූලි 23 විගණිත දින වන විටත් ටෙන්ඩර්කර බදු දීමට කටයුතු කර නොතිබුණි.

2.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ රු.26,872,102 ක අත ඉතිරි මුදල් ශේෂයක් පැවති අතර එම මුදල් සභාවට ආදායමක් ලැබෙන අයුරින් කෙටිකාලීන හෝ තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් එකක් රු.100,000 බැගින් මහජන බැංකුවේ ආශ්වර්යා ඉතුරුම් සහතික පත් 10 ක 2010 දෙසැම්බර් 01 දින රු.1,000,000 ක් ආයෝජනය කර තිබූ අතර, මාස 12 කල් පිරීමේ දී 5% ක වාර්ෂික පොලිය සමඟ මුල් මුදල ආපසු ලබාගෙන නව ගිණුමක් විවෘත කළ හැකි බව සහතික පතෙහි දක්වා තිබුණද, කල් පිරීමේදී මුදල් ලබා ගෙන වැඩි පොලියක් ලබා දෙන දිගු කාලීන ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීමට කටයුතු නොකර 2011 දෙසැම්බර් 01 සිට 2012 දෙසැම්බර් 01 දක්වා 3.8% පොලියට ඉතුරුම් සහතික පත්වලම තැබීමට ඉඩහැර තිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් විනාශ කිරීමට නිර්දේශ කර තිබූ භාණ්ඩ විෂයයන් 32 ක් විනාශ කිරීමට හා ගිණුම්වලින් ඉවත් කිරීමට (2013 ජූලි 13) දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් දෙකක වසර 6 සිට 8 දක්වා කාලයක් තුළ කිසිදු ගනුදෙනුවක් කිරීමකින් තොරව රු. 239,579 ක අක්‍රිය මුදල් ශේෂයක් පැවතින.

2.4 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ආධාර මත රු.12,655,752 ක් වැයකර ඉදිකරන ලද පූගොඩ පුස්තකාල ගොඩනැගිල්ල සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිවිසුම් ප්‍රකාරව මාස 9 ක කාලයක් තුළ සියළු ඉදිකිරීම් කටයුතු නිමකර අවසන් කළයුතු වුවත්, නිම කිරීමේ කටයුතු අවසන් වීම සඳහා වසර 2ට අධික කාලයක් ගතවී තිබුණි.

(ආ) ණය ගෙවීමේ සහන කාලය වසර 2 ක් දී තිබූ නමුත් ඉදි කිරීමේ කටයුතු සඳහා වසර 3 කට ආසන්න කාලයක් ගතවී තිබූ අතර, පුස්තකාලය විවෘත කිරීම 2013 අගෝස්තු 28 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) 2012 සැප්තැම්බර් 25 දින උපදේශක ආයතනයේ නිලධාරියෙකු, ව්‍යාපෘති ඉංජිනේරු, වැඩ අධිකාරී, තාක්ෂණ නිලධාරී යන අය විසින් කරන ලද පරීක්ෂණය අනුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් වල අඩුපාඩු විශාල ප්‍රමාණයක් හඳුනාගෙන තිබූ අතර, එම අඩුපාඩු 2013 අගෝස්තු වන විටත් නිවැරදි කිරීම් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවීය. එසේ වුවද, අවසන් ගෙවීමද ගෙවා තිබූ අතර, නිරීක්ෂණය වූ අඩුපාඩු සකසා ගැනීම සඳහා රු.260,286 ක්වූ සියයට 10 ක රඳවා ගැනීමේ මුදල ප්‍රමාණවත්ද යන්න මතභේදයට ලක්විය.

2.5 <u>ඉඩම් කොටස්කර විකිණීම</u>

ඉඩම් කොටස්කර විකිණීම සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව පහත කරුණු අනාවරණය විය.

(අ) 1998 නොවැම්බර් 13 දිනැති අංක 1053/17 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව ඉඩම් කොටස්කර විකිණීමේදී අදාළ ඉඩම තුළ පොදු කාර්ය පහසුකම් සංවර්ධනය කිරීම අනිවාර්ය වුවත් කොම්ලාවත්ත/ ඉඳුරුගල්ල, කන්දහේනවත්ත රදාවාන, බෙලිගොල්ල වත්ත, මාලිගාවත්ත මැද්දේගම යන ඉඩම් කොටස් කර විකිණීමේදී විදුලිය සැපයීම, ස්ථිර කාණු පද්ධතිය සැකසීම, මූලික ජල පහසුකම් ලබාදීම, මාර්ග විධිමත් කිරීම යනාදිය පිළිබඳව ලිඛිත

සහතික ලබා ගෙන නොතිබුණු අතර එම කාර්යයන් ඉටු කිරීමේ කොන්දේසිවලට යටත්ව සභාපතිවරයා විසින් අනුමැතිය දී තිබුණි. එකී කොන්දේසි ඉටුකර ඇති බවට පසුවිපරම් කිරීමක් හෝ සිදුකර ඇති බවක්ද නිරීක්ෂණය නොවීය.

(ආ) ඉහත සඳහන් ඉඩම් කොටස්කර විකිණීමේදී සැලසුම් කමිටුවේ නිර්දේශ ලබා ගෙන නොතිබුණි.

(ඇ) අනු බෙදුම් කරන ඉඩමේ ප්‍රමාණය හෙක් 01 ට වැඩි 04 ට නොඅඩු නම් පාරවල් සඳහා වෙන්කළ බිම් හැර ඉඩමෙන් සියයට 08 නොඅඩු ප්‍රමාණයක ප්‍රදේශයක් ප්‍රජා සේවා හා විනෝද ක්‍රීඩා කටයුතු සඳහා වෙනකළ යුතු වුවත්, වෙන්දේසි කළ ඉඩම් වලින් පර්චස් 61.95 ප්‍රමාණයක් අඩුවෙන් ලබා ගෙන තිබුණි.

(ඈ) සභාවට පවරාගෙන ඇති කන්දෙවත්ත සහ බෙලිගොල්ලවත්ත යන ඉඩම්වලට අයත් පිළිවෙලින් පර්චස් 28.75 සහ පර්චස් 33.20 ක වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) මාලිගාවත්ත මැද්දේගම ඉඩමේ පර්චස් එකක වෙන්දේසි වටිනාකම රු.60,000 සහ 75,000 අතර අගයක් වූ නමුත් පොදු පහසුකම් ඉඩමේ වටිනාකම ගණනය කිරීමේදී පර්චස් එකක් රු.14,680 බැගින් ගණනය කර තිබුණි.

(ඊ) මාලිගාවත්ත මැද්දේගම ඉඩමේ පොදු පහසුකම් ඉඩම සභාවට පැවරීමේ ඔප්පුව අනුව හා ඉඩම් කොටස් කිරීම් සම්බන්ධ ලේඛනය අනව පර්චස් 23 ක් වුවත් ගිණුම්වල ස්ථාවර වත්කම් යටතේ පර්චස් 82.50 ක් ලෙස දක්වා තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) අයවැය ලේඛනයමය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය

(ඉ) වත්කම් කළමනාකරණය